සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	නර්තනය (දේශීය) - I	කාලය நேரம் Time	පැය 01යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- **විශේෂ උපදෙස්**
- සියලු ම අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න 30ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව II **උඩරට** නර්තනය හෝ III **පහතරට** නර්තනය හෝ IV **සබරගමු** නර්තනය යන කොටස් තුනෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- II, III හා IV වන කොටස්වලින් කවලමේ ප්‍රශ්න තෝරා නොගත යුතු ය. ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

සැලකිය යුතුයි:
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- **01- 10 තෙක් ප්‍රශ්නවල සුදුසු වචන තෝරන්න.**

1. ආගමික පුද පූජාවන් හි හේවිසි වාදන සඳහා දවුල, තම්මැට්ටම හා ..... භාවිත කරයි.
   i. බටනලාව ii හක්ගෙඩිය iii වස්දණ්ඩ iv හොරණෑව

2. මහනුවර ඇසල පෙරහැර අවසානයේ වස්දොස් දුරු කරනු වස් ..... ශාන්තිකර්මය පැවැත්වේ
   i. වලියක් මංගල්‍යය ය. ii. අවර මංගල්‍යය
   iii. කිරි ඉතුරුම් මංගල්‍යය iv. සූරිය මංගල්‍යය

3. නර්තන ශිල්පියෙකු ..... කිරීමේදී වර්ණ, රේඛා මගින් මුහුණේ හැඩතල උද්දීපනය සිදුකෙරේ.
   i. රංග රචනය ii. අංග රචනය iii. තිර රචනය iv. රූප රචනය

4. ..... යන කෝලම් චරිත පූර්ව හා අපර රංගයන්ට අයත් වේ.
   i. ජසයා හා මුදලි ii. නාරි ලතා හා සිංහ
   iii. හේවා හා ජසයා iv. නොංචි හා නාග කන්‍යා

Past Papers Wiki

5. නර්තනයක් සඳහා අලංකාර පද නිර්මාණයේ දී ..... පිළිබඳ වඩාත් අවධානය යොමුවීම වැදගත් වේ.

I. ආලෝකකරණය හා අංගරචනය
ii. සංගීතය හා ගායනය
iii. සම්ප්‍රදාය හා අංගහාර
iv. වේදිකාව හා පසුතල

6. ..... නර්තන සම්ප්‍රදායේ ශාරීරික සුඛනම්‍ය බව උදෙසා තෙල් සම්භාහනය හා කච්චකෙට්ට අභ්‍යාස සිදු කරයි.

I. කථකලි
ii. මණිපුරි
iii. භරත නාටයම්
iv. කථක්

7. බෙර සරඹ වාදනයේ දී භාවිත ස්වරාක්ෂර, ...යනුවෙන් ද හැඳින්වේ.

i. බීජාක්ෂර
ii. උපකාරාක්ෂර
iii. ගර්භාක්ෂර
iv. ඌෂ්මාක්ෂර

8. **"සොබමන් දෙවිවරු සඳෙනෙක් එතැනට.."** යන ගායනය .....නැටුමේදී භාවිත වේ.

I. පතුරු
ii. සවරම්
iii. චාමර
iv. රබන්

9. දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් ගී ගයමින් නැටූ බව ..... ගේ වාර්තාවේ සඳහන් වේ.

i. ඉබන් බතූතා
ii. රොබට් නොක්ස්
iii. ස්පිල්බර්ජන්
iv. ජෝන් ඩේව්

10. කරදිය මුද්‍රා නාට්‍යයේ සිසී ගේ චරිතය නිරූපණය කරන ලද්දේ..... මහත්මිය විසිනි.

I. මිරැන්ඩා හේමලතා
ii. ශ්‍රියානි රාජපක්ෂ
iii චන්ද්‍රලේඛා පෙරේරා
iv. වජිරා චිත්‍රසේන

11.



A



B



C

ඉහත A, B හා C ඡායාරූපයන්ගෙන් දැක්වෙන වේදිකා නිර්මාණ අයත් නාට්‍ය ශෛලීන් වනුයේ,

I. ශෛලිගත, මුද්‍රා හා තාත්වික වේ.
ii. මුද්‍රා, ස්වාභාවික හා තාත්වික වේ.
iii. තාත්වික, ශෛලිගත හා ගීත වේ.
iv. ගීත, තාත්වික හා ශෛලිගත වේ.

12. විලම්භ, මධ්‍ය හා දෘත ලය මානයන් සමගුණ, ... යනුවෙන් ද හැඳින්වේ.

I. දෙගුණ හා අටගුණ
ii. දෙගුණ හා සිවු ගුණ
iii තෙගුණ හා නවගුණ
iv. සිව්ගුණ හා අටගුණ

13. "කොකුම් පාට කිතුලින් බත් වළඳා ..... හිමිවන" මෙම ග්‍රහ පන්ති කවි පාදයේ හිස්තැනට ගැළපෙන වචනය කුමක් ද?

I. තුරඟට
ii. රාහුට
iii. ශනිදුට
iv. ඉඳුරට

14. දකුණු ඉන්දියාවේ නාග පට්ටම් නම් ස්ථානයෙන් ගෙන්වාගත් ..... පඬිවරයා විසින් උඩරට වන්නම් රචනා කළ බව කියැවේ.

I. විද්‍යාලංකාර
ii. අත්‍යාලංකාර
iii. ගණිතාලංකාර
iv. ධීරාලංකාර

15. කෝල්පාඩුව, දේවකෝල්පාඩුව හා පත්තිනි යන නර්තන දක්නට ලැබෙන්නේ පිළිවෙලින්,

i. පහන් මඩුව, ගම්මඩුව හා ගී මඩුවේ ය.

ii. කොහොඹා කංකාරිය, පහන් මඩුව හා දෙවොල් මඩුවේ ය.

iii. පහන් මඩුව, හත්දා ගී මඩුව හා පූනා මඩුවේ ය.

iv. දෙවොල් මඩුව, කිරිමඩුව හා පහන් මඩුවේ ය.


16. පත්තිනි හා දෙවොල් දෙවියන් වන්දනයට පාත්‍ර වන ජන නාටකය ලෙස සැලකෙන්නේ

I. සොකරි ii. කෝලම් iii. රූකඩ iv. නාඩගම්

17. පිළිවෙළින් A හා B රූපයන්ගෙන් උපදින රසයන් වන්නේ,



A



B

i. කරුණා හා හාස්‍ය වේ.

ii. ශෘංගාර හා ශාන්ත වේ.

iii. කරුණා හා ශෘංගාර වේ.

iv. ශෘංගාර හා අත්භූත වේ.

18. මාත්‍රා 2 + 2 + 4 යන තාල රූපය සඳහා යෙදිය යුතු තාල සංකේත දැක්වෙන වරණය තෝරන්න.

i. ∧, /, ∧ ii. ∧, ∧, / iii. /, /, ∧ iv. ∧, /, ∧

19. දේශීය මුද්‍රා නාට්‍ය සඳහා ඉඟිනළු යන නාමය ප්‍රථම වරට යොදා ගන්නා ලද්දේ .....

I. චිත්‍රසේන ඩයස් විසිනි. ii. ප්‍රේමකුමාර එපිටවෙළ විසිනි.

iii. ඇස්. පණිභාරත විසිනි. iv. නිමල් වෙල්ගම විසිනි.

20. ශාන්ති කර්මයන්හි භාවිත කවි ගායන, දෙබස්, සංවාද අයත් වන්නේ,

i. ආංගික අභිනයට ය. ii. වාචික අභිනයට ය.

iii. සාත්වික අභිනයට ය. iv. ආහාර්ය අභිනයට ය.

21. සකපෝරුව හා ඉල්ලම් කුර භාවිත වන්නේ,

i. මැටි හා පතල් කර්මාන්තයට ය. ii. පතල් හා කුඹල් කර්මාන්තයට ය.

iii. කොහු හා තේ කර්මාන්තයට ය. iv. කුරුඳු හා කෘෂි කර්මාන්තයට ය.

22. නර්තනය ප්‍රගුණ කිරීමෙන් සංවර්ධනය නොවන චිත්තවේගික කුසලතාවක් නොවන්නේ මින් කුමක් ද?

I. තර්කානුකූලව කටයුතු කිරීම ii. නිර්මාණශීලීබව


iii. චලන වේගය හා හැකියාව iv. මානසික සංවර බව

23. අරච්චෙට්ටු හා සුලකු යන ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන වන්නේ,

i. කුළු හා ගොයම් නැටුම් වේ. ii. ගොයම් හා කුළු නැටුම් වේ.

iii. කළ හා ලී කෙළි නැටුම් වේ. iv. ලී කෙළි හා තාලම් නැටුම් වේ.

■ ප්‍රශ්න අංක 24 සිට 27 දක්වා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරෙන් තෝරන්න.

	A	B	C
1. තීරුව			
2. තීරුව			
3. තීරුව			

24. භාරත නාට්‍යම් හා කථකලි නර්තන සම්ප්‍රදායන් හි තාල වාද භාණ්ඩ දැක්වෙනුයේ,

i. 3 තීරුව B හා 1 තීරුව B මගිනි.
ii 1 තීරුව B හා 3 තීරුව B මගිනි.
iii. 2 තීරුව B හා 2 තීරුව C මගිනි
iv. 3 තීරුව A හා 1 තීරුව B මගිනි.

25. වාදනය සමඟ නර්තනයට යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ පමණක් ම ඇතුළත් වන්නේ,

i. 1 තීරුව A හා 2 තීරුව B තුළ ය.
ii 2 තීරුව B හා 3 තීරුව C තුළ ය.
iii. 2 තීරුව A හා 2 තීරුව C තුළ ය.
iv. 3 තීරුව B හා 1 තීරුව C තුළ ය.

26. උඩරට පළාත්හි සුවිසි විවරණ, සත් සතිය හා පන්සාළිස්වස යන ආගමික උත්සව අවස්ථාවලදී ගායනයේ දී අත දෙනුයේ,

i. 1 තීරුව A
ii. 2 තීරුව B
iii. 2 තීරුව C
iv. 3 තීරුව A

27. පංචතූර්ය වාදන වර්ගීකරණය අනුව විතත හා ඝන වාද භාණ්ඩ දක්නට ඇත්තේ,

i. 1 තීරුව A හා 2 තීරුව B රූප වල ය.
ii 1 තීරුව B හා 3 තීරුව A රූප වල ය.
iii. 1 තීරුව C හා 3 තීරුව A රූප වල ය.
iv. 2 තීරුව C හා 2 තීරුව A රූප වල ය.

28. මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ පර්යේෂණ කෘතිය ඇතුළත් වරණය තෝරන්න.

I. පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය
ii. ශාන්තිකර්ම සහ සිංහල සමාජය
iii. සිංහල නර්තන කලාව
iv. සමන් දේවාල පුද සිරිත්

29. **විජයතුමා තම්මැන්නේ පිරිවර සෙන් සමගින්නේ ...** යන ගීතයෙහි පද රචකයා වන්නේ,

i. රඹුක්කන සිද්ධාර්ථ හිමි ය.
ii. කිරිඇල්ලේ ඥාණවිමල හිමි ය.
iii. වීදාගම මහා මෛත්‍රී හිමි ය.
iv. ටිබෙට් ජාතික එස් මහින්ද හිමි ය.

30. නන්දිකේශ්වර විසින් රසභාව පිළිබඳ පළ කරන ලද කෘතිය වන්නේ,

i. අභිනය දර්පණය ය.
ii. නාට්‍ය ශාස්ත්‍රය ය.
iii. අභිනව භාරතී ය.
iv. ගීත ගෝවින්දය ය.

II කොටස
උඩරට නර්තනය

31. ගැටබෙරයට අයත් කොටස් ලෙස සැලකෙන්නේ,
    i. බෙර පුහුල, හයිතට්ටුව හා වරපට
    ii. ගිගිරි වළල්ල, බෙර පුහුල හා වරපට ය.
    iii. කන්වරය, වලයම හා ඉල්ලම් මුදු ය.
    iv. ගැටය, වරමුදු හා ගැටිය ය.

32. උඩරට සම්ප්‍රදායට අයත් ගායන සහිත නර්තන අංග වන්නේ,
    i. කුවේණි අස්න හා මල්මඩුපුරය වේ.
    ii. ගණදෙවි හැල්ල හා හත්පදය වේ.
    iii. කතාපහ හා කෝල් පාඩුව වේ.
    iv. මඩුපුරය හා කොහොඹා හැල්ල වේ.

33. සිංහරාජ වන්නමට අයත් "**ඡෙං තත් තත් ....**" අඩව්ව නටනු ලබන තාල රූපය නම්,
    i. $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4 වේ.
    ii. $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 වේ.
    iii. $\acute{1}$ 2 3 | $\acute{1}$ 2 3 වේ.
    iv. $\acute{1}$ 2 3 4 | $\acute{1}$ 2 3 4 වේ.

34. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ පුද ලබන දෙවියන් දැක්වෙන වරණය තෝරන්න.
    I. පත්තිනි, දෙවොල් හා වීරමුණ්ඩ
    ii. කොහොඹා, වීරමුණ්ඩ හා වාහල
    iii. වීරමුණ්ඩ, කොහොඹා හා මලය
    iv. සමන්, විභීෂණ හා පත්තිනි

35. "**වනපැත්ත බියපත්ව සයනම්**" මෙම කවි පදය අයත් වන්නේ
    i. හනුමාවන්නමට ය.
    ii. මුසලඩි වන්නමටය.
    iii. තුරඟා වන්නමට ය.
    iv. සැවුලා වන්නමට ය.

36. උඩරට වෙස් ඇඳුම් කටට්ලයට අයත් කොටස් වන්නේ
    i. ජඨාව, පායිම්පත හා අත්පොට සතර ය.
    ii. ශිඛාබන්ධනය, අවුල්හැරය, හා උරබාහු ය.
    iii. තෙල්කච්චිය, හස්තකඩය හා සිලම්බු ය.
    iv. නෙත්තිමාලය, තෝඩුපත් හා කඩුක්කන් ය.

37. "**තකු ද තකුතක තකට කුං දත් තග්ගජිංතක තකට කුං දත් .....**" මෙය,
    i. කස්තිරම කි.
    ii. සීරුමාරුව කි.
    iii. අඩව්ව කි.
    iv. ඉරට්ටිය කි.

38. ගොඩ සරඹ කස්තිරම් අතර සුරල් පිළිබඳ මුලින්ම අවබෝධය ලබාදෙනුයේ
    i. බඹර සරඹයෙනි.
    ii. පැනීම් සරඹයෙනි.
    iii. දෑත පැගීම සරඹයෙනි.
    iv. චන්ද්‍රිකා සරඹයෙනි.

39. **කුදාංත ගත දොං වට්ටමේ** දෙවන අඩව්ව ලෙස ව්‍යවහාර වේ.
    i. තත්තොග කක කොග ....,
    ii. තත් තකට තකරොං ....,
    iii. තාං දොම්තිගත ....,
    iv. තත්කඩ තරිකිට ජිත් තත් ....,

40. පොල් පන්දම හා ඊගස යන රංග භාණ්ඩ භාවිත වන්නේ
    i. ආවැන්දුමට ය.
    ii. දානපහට ය.
    iii. කුවේණි අස්නයට ය.
    iv. හත් පදයට ය.

PAST PAPERS WIKI

III කොටස

පහතරට නර්තනය

31. පහතරට බෙරයට අයත් කොටස් ලෙස වන්නේ,

i. කැපුම් හම, වරපට හා ගිගිරි වළල්ල ය.
ii. හයිතට්ටුව, සුරල් තට්ටුව හා බෙර කඳ ය.
iii. බෙර ගැට්ය, ඉල්ලම් මුදු හා බෙර ලණුව ය.
iv. ඉල්ලම් මුදු, වරපට හා බෙර පුහුල ය.

32. පහතරට නැටුම් සම්ප්‍රදායට අයත් නර්තනාංග ලෙස සැළකෙන්නේ,

i. යහන් දැක්ම හා ආවැන්දුම ය.
ii. කෝල්පාඩුව හා වාහල ය.
iii. හත් පදය හා දෙවොල් ය.
iv. පත්තිනි හා තෙල්මෙ ය.

33. ශුද්ධතාලය සින්දු වන්නමට අයත් **"තත් ගුද ගත දිත් දිත් තෙයි"** ඉරට්ටිය නටනු ලබන තාල රූපය,

i. $\hat{1}$ 2 | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 වේ.
ii. $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 වේ.
iii. $\hat{1}$ 2 | $\hat{1}$ 2 | $\acute{1}$ 2 3 4 වේ.
iv. $\hat{1}$ 2 3 | $\acute{1}$ 2 3 4 වේ.

34. දෙවොල් මඩුව ශාන්ති කර්මයේ පුද ලබන දෙවියන් දැක්වෙන වරණය තෝරන්න.

i. ගම්බාර, මංගර හා මලය
ii. වීරමුණ්ඩ, පත්තිනි හා විෂ්ණු
iii. පත්තිනි, දෙවොල් හා වාහල
iv. පත්තිනි, සමන් හා වාහල

35. **"නාරායන නිතිනා දිසි දීර්ඝති ලෝ සතරක දෙමිනා"** යන කවිපාදය අයත් වන්නේ

i. හනුමන්තා තාලය සින්දු වන්නමට ය.
ii. අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නමට ය.
iii. ඊශ්වර කුණ්ඩ තාලය සින්දු වන්නමට ය.
iv. ග්‍රහ දණ්ඩ තාලය සිංදු වන්නමට ය.

36. පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයට අයත් කොටස් වන්නේ,

i. හස්තකඩය හා නරු සතර වේ.
ii. තෙල් කච්චිය හා නළල් පටිය වේ.
iii. තෙල් කච්චිය හා අත්පොට සතර වේ.
iv. ඉන හැඩය හා තෝඩු පත් වේ.

37. **'දොං තත් දිම් ගත ගුගු දිත ගත'** මෙය,

i. ඊශ්වර කුණ්ඩ තාලයේ ඉරටිය යි.
ii. නාතිලිංචි තාලයේ ඉරට්ටිය යි.
iii. හනුමන්තා තාලයේ ඉරට්ටිය යි.
iv. ශුද්ධ තාලයේ ඉරට්ටිය යි.

38. **'රිම් ගත ගුද ගත් තම්, ගත් දැහිං ගුම් දැහිං'** යනු ඉරට්ටිය අයත් වන්නේ,

i. 8 වන ඉලංගම් සරඹයට ය.
ii. 12 වන ඉලංගම් සරඹයට ය.
iii. 11 වන ඉලංගම් සරඹයට ය.
iv. 10 වන ඉලංගම් සරඹයට ය.

39. **ගුද ගති ගත වට්ටම** නැටීමේ දී පදය නැටීමෙන් අනතුරුව නටනු ලබන්නේ,

i. අත්තාඩිය යි.
ii. ඉරට්ටිය යි.
iii. සුරල යි.
iv. අලංකාරය යි.

40. නර්තනයේ දී පූජා භාණ්ඩය ලෙස පොල් මල දරා ඉදිරිපත් කරනුයේ

i. පත්තිනි නර්තනය යි.
ii. දෙවොල් නර්තනය යි.
iii. වාහල නර්තනය යි.
iv. තොරන්යාගය නර්තනය යි.

IV කොටස
සබරගමු නර්තනය

31. දවුල් බෙරයට අයත් කොටස් ලෙස සැලකෙන්නේ,
   i. බෙර පුහුල, කන්වරය හා වෙනිවර ය.
   ii. ගැටිය, ඉල්ලම් මුදු හා තට්ටුව ය.
   iii. හයිතට්ටුව, හැක්ම හා වරපටය ය.
   iv. කැපුම්හම, වරපට හා සුරත්තට්ටුව ය.

32. සබරගමු නැටුම් සම්ප්‍රදායට අයත් නාට්‍යමය පෙළපාළින් වන්නේ,
   i. යක්කම් පහ හා මී බන්ධනය ය.
   ii. මරා ඉපැද්දීම හා අඹවිදමන ය.
   iii. අසුර යක්කම හා ගුරුගේමාලව ය.
   iv. පොත්කඩේ පාළිය හා රාමාමැරීම ය.

33. විරාඩි වන්නමට අයත් "**ගත් තකු ජිත් තත් දොංකඩ තරිකිට ජිත් ජිත් ....**" අඩවිව නටනු ලබන තාල රූපය නම්,
   i. ́1 2 3 4 | ́1 2 3 4 වේ.
   ii. ̂1 2 | ́1 2 3 වේ.
   iii. ́1 2 3 | ́1 2 3 වේ.
   iv. ̂1 2 3 | ́1 2 3 4 වේ.

34. පහන් මඩු යාගයේ පුද ලබන දෙවියන් දැක්වෙන වරණය තෝරන්න.
   I. දෙවොල්, බණ්ඩාර හා කොහොඹා
   ii. මංගර, පත්තිනි හා වීරමුණ්ඩ
   iii. පත්තිනි, දෙවොල් හා වාහල
   iv. වාහල වීරමුණ්ඩ හා පත්තිනි

35. "**රිටු විමනා බිඳු ලමිනා - බහු නදනා රැකෙන මෙනා ...**" මෙම කවි පදය අයත් වන්නේ,
   i. කුදිරඩි වන්නමට ය.
   ii. කොවුලා වන්නමට ය.
   iii. විරාඩි වන්නමට ය.
   iv. තිසරා වන්නමට ය.

36. සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් කොටස් වන්නේ,
   I. ගහල, පායිම්පත හා ඉණහැඩය යි.
   ii. නෙත්තිමාලය, හස්තකඩය හා අත්පොට සතර යි.
   iii. පොත්පොට, නෙත්තිමාලය හා පායිම්පත යි.
   iv. පබළු හැට්ටය, කඩුක්කන් හා උල්උඩය යි.

37. "**කුදිත ගතික කුද ගති ගත කුද ගත**" මෙය,
   i. අඩවිවකි
   ii. කලාසමකි
   iii. හමාරයකි
   iv. අඩුකෝල් පදයකි.

38. '**කිත්තා කිත්තා ජෙජ් ජෙංතා, තත්කඩ තරිකිට // ජෙජ් ජෙංතා**' යනු
   i. 12 වන දොඹින පදය යි.
   ii. 9 වන දොඹින පදය යි.
   iii. 10 වන දොඹින පදය යි.
   iv. 7 වන දොඹින පදය යි .

39. "**තත් කිටහර්, ජිත් කිට කුං ...**" යන මෙම අඩවිව අයත් වන්නේ,
   i. ගමන් මාත්‍රයට ය.
   ii. මුල් මාත්‍රයට ය.
   iii. යාදිනී මාත්‍රයට ය.
   iv. සින්දු මාත්‍රයට ය.

40. දුම්මල පාලිය නර්තනයට භාවිත රංග භාණ්ඩය
   i. පන්දම යි.
   ii. ඊතලය යි.
   iii. අගුරු කබල යි.
   iv. කොතලය යි.

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11	නර්තනය (දේශීය) - II	කාලය நேரம் Time	පැය 02යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

උපදෙස්:

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමිවේ.

---

1) සියලු ම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. වේෂ නිරූපණය අයත් වන්නේ සතර අභිනයෙන් ..... අභිනයට ය.

ii. අතීතයේ මළබෙර වාදනයෙහි ලා ..... බෙරය භාවිත කළ බව පිළිගැනේ.

iii. දේශීය වාද්‍ය භාණ්ඩ අතර වන රබාන ..... බෙරය යනුවෙන් ද හැඳින්වේ.

iv. කරදිය මුද්‍රා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ, පසුතල නිර්මාණයෙහි ලා ..... මහතා මූලික විය.

v. රුප්පා යකුන්, මෙලෙයි යකුන් හා කඩවර යක්ෂයා ..... ශාන්තිකර්මයේ පුද ලබයි.

vi. ගද්‍ය හා පද්‍ය ලක්ෂණ දැකිය හැකි ගායන විශේෂයක් ලෙස ..... සී පද දැක්විය හැක.

vii. ..... සොකරි නාටකයේ ප්‍රබල හාස්‍යොත්පාදක චරිතයකි.

viii. සෞන්දර්ය ගුරු පුහුණුව සඳහා වූ ..... ගුරු විද්‍යාලය 1972 වර්ෂයේ ස්ථාපිත විය.

ix. පහත මුද්‍රා නාට්‍ය නිර්මාණයන්ට පුරෝගාමී වූ කලාකරුවන් කවුරුන් ද?

(අ) සැළලිහිණිය : (ආ) ග්‍රහ අපලය :

x. පහතරට නර්තන සම්ප්‍රදායේ 'ඉරට්ටිය' යන්නට සමාන වන උඩරට හා සබරගමු නර්තන පද කොටස නම් කරන්න.

(අ) උඩරට: (ආ) සබරගමු:

2) i. මාත්‍රා (2+2+3) දෙසුළු මැදුම් තුන් තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර ගත කරන්න.

ii. මාත්‍රා (4+4) තනි තිතට අයත් වන්නමක / සින්දු වන්නමක මුල් කවි පාදය ප්‍රස්තාර කරන්න.

iii. 'දොං ජිංත ගත දොංත' වට්ටම හෝ ගමන් මාත්‍රය හෝ ගුද ගදිගත වට්ටමේ, අඩවිවක් හෝ ඉරට්ටියක් ප්‍රස්තාර කරන්න.

3) පහත සඳහන් මාතෘකා අතරින් 03න් කෙටියෙන් විස්තර කරන්න.

i. වන්නම් ii. ආංගික අභිනය

iii. ශාන්තිකර්ම ආශ්‍රිත වාදන අවස්ථා iv. සරඹ අභ්‍යාස

v. මිරැන්ඩා හේමලතා මිය

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4) දේශීය ශාන්තිකර්මයන්හි ව්‍යූහය හා අන්තර්ගතයේ සමානතා මෙන්ම අසමානතා ප්‍රදර්ශනය වේ.

i. කොහොඹා කංකාරිය හා දෙවොල් මඩු යාගයේ පුරාවෘත්තයන් හි සමාන හා අසමානතා දෙක බැගින් දක්වන්න.

ii. දෙවොල් මඩුව හා පහන් මඩුව යාගයේ පොදුවේ දැකිය හැකි නාට්‍යමය පෙළපාලි දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

iii. ශාන්ති කර්මය වූ කලී මානව සබඳතා, සාරධර්ම, සංවර්ධනයට දායක වූවකි. විමසන්න.

5) ජන නැටුම් හා ජන නාටක, ජන ජීවිතය පිළිබිඹු වන කැඩපතකි.

i. චාමර හෝ මෝල්ගස් හෝ හටන් නැටුමට අයත් ගායනයක් දක්වා එම ගැමි නැටුම පිළිබඳ ඇගයීමක් කරන්න.

ii. කෝලම් හා සොකරි ජන නාටකයට අයත් කාන්තා චරිත දෙකක් සංසන්දනාත්මකව ඇගයීමට ලක් කරන්න.

iii. මුදලි හා වෙදරාළ යන ජන නාටක චරිතයන් තත්කාලීන ප්‍රභූ සමාජය උපහාසයට ලක් කරයි. විමසන්න.

6) පහත රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C



D



E

i. A හා B රූපවල දැක්වෙන දේශීය මුද්‍රා නාට්‍ය දෙක නම් කර, ඉන් එක් මුද්‍රා නාට්‍යයක කතා තේමාව විස්තර කරන්න.

ii. C හා D රූපවල දැක්වෙන නර්තන සම්ප්‍රදායන් නම් කර ඉන් එක් නර්තන සාම්ප්‍රදායක ආගමික පසුබිම පැහැදිලි කරන්න.

iii. E රූපයේ දැක්වෙන රූපවාහිනී නර්තනය ඇසුරු කර ප්‍රාසාංගික වේදිකාවේ භාවිත තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ අගයන්න.

7) i. 'නර්තන අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ප්‍රබල සමාජ සාරධර්ම ප්‍රදර්ශනය වේ.' අදහස් දක්වන්න.

ii. සමාජ මාධ්‍ය (Social media) අධ්‍යතනයේ නර්තන කලාවට ප්‍රබල දායකත්වයක් සපයයි. කරුණු දක්වන්න.

iii. අධ්‍යතන නර්තනයේ බොහෝ අංගයන් වාණිජකරණයට ලක්ව තිබේ. විමසුමට ලක් කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank